තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති; ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සෙය්‍යං – චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ, සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානෙය්‍ය''න්ති සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (16)

18. ආකඞ්ඛෙය්‍ය චෙ භික්ඛවෙ භික්ඛු ''ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා[1] සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය''න්ති, සීලෙස්වෙවස්ස පරිපූරකාරී අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රෑහෙතා සුඤ්ඤාගාරානං. (17)

19. ''සම්පන්නසීලා භික්ඛවෙ විහරථ සම්පන්නපාතිමොක්ඛා. පාතිමොක්ඛසංවරසංවුතා විහරථ ආචාරගොචරසම්පන්නා. අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛථ සික්ඛාපදෙසූ''ති'' ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තන්ති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

**ආකඞ්ඛෙය්‍යසුත්තං ඡට්ඨං.**

## 1. 1. 7

## වත්ථූපමසුත්තං

1. **එවං** මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. සෙය්‍යථාපි භික්ඛවෙ වත්ථං සඞ්කිලිට්ඨං මලග්ගහිතං, තමෙනං රජකො යස්මිං යස්මිං රඞ්ගජාතෙ උපසංහරෙය්‍ය යදි නීලකාය යදි පීතකාය යදි ලොහිතකාය යදි මඤ්ජට්ඨකාය,[2] දුරත්තවණ්ණමෙවස්ස. අපරිසුද්ධ-

වණ්ණමෙවස්ස. තං කිස්ස හේතු? අපරිසුද්ධත්තා භික්ඛවෙ වත්ථස්ස. එව-මෙව ඛො භික්ඛවෙ චිත්තෙ සඞ්කිලිට්ඨෙ දුග්ගති පාටිකඞ්ඛා.

1. අභිසඤ්ඤූදය, PTS. 2. මංජෙට්ඨකාය, මජසං.



ඒ සත්ත්වයෝ කාබුත් මරණින් මතු මනා ගති ඇති ස්වර්ගලොකයට ප්‍රති-සන්ධි වශයෙන් පැමිණියාහු ය. මෙසේ පිරිසිදු වූ මිනිසැස ඉක්මවා සිටි දිවැසින් ච්‍යුත වන උපදින හීන වූ ප්‍රණීත වූ සුවර්ණ වූ දුර්වර්ණ වූ සුගතිගත වූ දුගති-ගත වූ සත්ත්වයන් දකින්නෙම්වා, කම් වූ පරිදි මිය පරලොව ගිය සත්ත්ව-යන් දැනගන්නෙම්වා'' යි කැමැති වන්නේ නම් ශීලයෙහි ම සම්පූර්ණ-කාරී වන්නේ ය. ස්වකීය චිත්ත සමථයෙහි එක්වන් යෙදුනේ බැහැර නො කළ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

18. මහණෙනි, මහණෙක් ''ආශ්‍රවක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත වූ චිත්තවිමුක්තිය (අර්හත්ඵල සම්ප්‍රයුක්ත සමාධිය) ප්‍රඥාවිමුක්තිය (අර්හත් ඵල සම්ප්‍රයුක්ත ප්‍රඥාව) ඉහාත්මයෙහි දී ම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන සාක්ෂාත් කොට එයට පැමිණ වාසය කරන්නෙම්වා'' යි කැමැති වන්නේ නම් ශීලයෙහි ම සම්පූර්ණකාරී වන්නේ ය. ස්වකීය චිත්ත සමථයෙහි එක්වන් යෙදුනේ බැහැර නො කළ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරයන් වඩන්නෙක් වන්නේ ය.

19. ''මහණෙනි, පිරිපුන් සිල් ඇතිව ප්‍රාතිමොක්ෂ සම්පන්න ව වසවු. ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත ව ආචාරයෙන් හා ගොචරයෙන් සමෘද්ධ ව වසවු. ස්වල්පමාත්‍ර වූ වරදෙහි භය දක්නාසුලු ව සමාදන් ව ශික්ෂාපදයන්හි හික්මෙවු'' යි මෙසේ යම් ඒ වචනයෙක් කියන ලද ද, එය මේ සඳහා කියන ලදී.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු වූ ඒ භික්ෂූහු භාග්‍ය-වතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ.

**ආකාඞ්ඛෙය්‍ය සූත්‍රය සවැනි යි.**

## 1. 1. 7

## වත්ථූපම සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ **සැවැත්නුවර** සමීපයෙහි වූ **ජේතවන** නම් අනේපිඬුසිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන් ඇමතූ සේක. භික්ෂූහු 'වහන්සැ'යි භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළ සේක.

2. මහණෙනි, කිලිටි වූ මල ගත් වස්ත්‍රයෙක් වේ ද, ඒ වස්ත්‍රය රජකයෙක් නිල්පැහැය පිණිස හෝ රත්වත්පැහැය පිණිස හෝ ලේවත්-පැහැය පිණිස හෝ මදටිය(මදරත්)පැහැය පිණිස හෝ යම් යම් රඳනෙක බහා ලන්නේ නම්, එය නො මනා ව රැඳූ පැහැ ඇත්තක් ම වන්නේ ය. අපිරිසිදු පැහැ ඇත්තක් ම වන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, වස්ත්‍රය අපිරිසිදුබැවිනි. මහණෙනි, එපරිද්දෙන් ම සිත කිලිටි වූ කල්හි දුගතිය කැමැති විය යුතු යි.



3. සෙය්‍යථාපි භික්ඛවෙ වත්ථං පරිසුද්ධං පරියොදාතං, තමෙනං රජකො යස්මිං යස්මිං රඞ්ගජාතෙ උපසංහරෙය්‍ය යදි නීලකාය යදි පීතකාය යදි ලොහිතකාය යදි මඤ්ජෙට්ඨකාය, සුරත්තවණ්ණමෙවස්ස. පරිසුද්ධවණ්ණ-මෙවස්ස. තං කිස්ස හෙතු? පරිසුද්ධත්තා භික්ඛවෙ වත්ථස්ස. එවමෙව ඛො භික්ඛවෙ චිත්තෙ අසඞ්කිලිට්ඨෙ සුගති පාටිකඞ්ඛා.

4. කතමෙ ච භික්ඛවෙ චිත්තස්ස උපක්කිලෙසා: අභිජ්ඣාවිසම-ලොභො චිත්තස්ස උපක්කිලෙසො. බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො. කොධො චිත්තස්ස උපක්කිලෙසො. උපනාහො චිත්තස්ස උපක්කිලෙසො. මක්ඛො චිත්තස්ස උපක්කිලෙසො. පළාසො චිත්තස්ස උපක්කිලෙසො. ඉස්සා චිත්තස්ස උපක්කිලෙසො. මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසො. මායා චිත්තස්ස උපක්කිලෙසො. සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසො. ථම්භො චිත්තස්ස උපක්කිලෙසො. සාරම්භො චිත්තස්ස උපක්කිලෙසො. මානො චිත්තස්ස උපක්කිලෙසො. අතිමානො චිත්තස්ස උපක්කිලෙසො. මදො චිත්තස්ස උපක්කිලෙසො. පමාදො චිත්තස්ස උපක්කිලෙසො.

5. ස ඛො සො භික්ඛවෙ භික්ඛු අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජ්ඣාවිසමලොභං චිත්තස්ස උපක්කිලෙසං පජහති. බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා බ්‍යාපාදං චිත්තස්ස උපක්කිලෙසං පජහති. කොධො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා කොධං චිත්තස්ස උපක්කිලෙසං පජහති. උපනාහො චිත්තස්ස උපක්කි-ලෙසොති ඉති විදිත්වා උපනාහං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මක්ඛො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මක්ඛං චිත්තස්ස උපක්කිලෙසං පජහති. පළාසො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා පළාසං චිත්තස්ස උපක්කිලෙසං පජහති. ඉස්සා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ඉස්සං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මායා චිත්තස්ස උපක්කි-

ලෙසොති ඉති විදිත්වා මායං චිත්තස්ස උපක්කිලෙසං පජහති. සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසං පජහති. ථම්භො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ථම්භං චිත්තස්ස උපක්කිලෙසං පජහති. සාරම්භො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා සාරම්භං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මානො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මානං චිත්තස්ස උපක්කිලෙසං පජහති. අතිමානො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අතිමානං චිත්තස්ස උපක්කිලෙසං පජහති. මදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මදං චිත්තස්ස උපක්කිලෙසං පජහති. පමාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා පමාදං චිත්තස්ස උපක්කිලෙසං පජහති.



3. මහණෙනි, පිරිසුදු පබසර වතක් වේ ද, එය රජකයෙක් නිල්පැහැය පිණිස හෝ රත්වත්පැහැය පිණිස හෝ ලේවත්පැහැය පිණිස හෝ මදටිය පැහැය පිණිස හෝ යම් යම් රඳනෙක බහා ලන්නේ නම්, එය මනා පැහැ ඇත්තක් ම වන්නේ ය. පිරිසිදු පැහැ ඇත්තක් ම වන්නේ ය. ඒ කවර හෙයින යත්: මහණෙනි, වස්ත්‍රය පිරිසිදු බැවිනි. මහණෙනි, එපරිද්දෙන් ම සිත නො කිලිටි වූ කල්හි සුගතිය ම කැමැති විය යුතු යි.

4. මහණෙනි, චිත්තොපක්ලෙශයෝ (සිත කෙලෙසන ධර්මයෝ) කවරහු ද ? අභිධ්‍යා (-සවකීය වස්තුවෙහි ඡන්දරාගය) විෂමලෝභය (-මෙරමා අයත් වස්තුවෙහි ඡන්දරාගය) සිත කෙලෙසන්නෙකි. ව්‍යාපාදය සිත කෙලෙසන්නෙකි. ක්‍රොධය සිත කෙලෙසන්නෙකි. උපනාහය (බද්ධවෛරය) සිත කෙලෙසන්නෙකි. මක්ඛය (ගුණ මකු බව) සිත කෙලෙසන්නෙකි. පළාසය (යුගග්‍රාහය) සිත කෙලෙසන්නෙකි. ඊර්ෂ්‍යාව සිත කෙලෙසන්නකි. මසුරුබව සිත කෙලෙසන්නෙකි. මායාව සිත කෙලෙසන්නකි. කපටිබව සිත කෙලෙසන්නෙකි. ථම්භය (තදබව) සිත කෙලෙසන්නෙකි. සාරම්භය (එකට වැඩියෙන් එකක් කිරීම) සිත කෙලෙසන්නෙකි මානය සිත කෙලෙසන්නෙකි. අතිමානය සිත කෙලෙසන්නෙකි. මදය සිත කෙලෙසන්නෙකි. ප්‍රමාදය සිත කෙලෙසන්නෙකි.

5. මහණෙනි, ඒ භික්ෂු තෙම අභිධ්‍යාවිෂමලෝභය සිත පිළිබඳ උපක්ලේශයෙකැයි මෙසේ දැන සිත පිළිබඳ උපක්ලේශ වූ අභිධ්‍යා විෂමලෝභය දුරු කරයි. ව්‍යාපාදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ව්‍යාපාදය දුරු කරයි. ක්‍රොධය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ක්‍රොධය දුරු කරයි. උපනාහය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන උපනාහය දුරු කරයි. මක්ඛය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මක්ඛය දුරු කරයි. පළාසය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන පළාසය දුරු කරයි. ඊර්ෂ්‍යාව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ

දැන සිත කිලුටු කරන ඊෂ්‍යාව දුරු කරයි. මසුරුබව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මසුරුබව දුරු කරයි. මායාව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මායාව දුරු කරයි. කපටිබව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන කපටිබව දුරු කරයි. ථම්භය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ථම්භය දුරු කරයි. සාරම්භය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන සාරම්භය දුරු කරයි. මානය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මානය දුරු කරයි. අතිමානය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු-කරන අතිමානය දුරු කරයි. මදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන මදය දුරු කරයි. ප්‍රමාදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැන සිත කිලුටු කරන ප්‍රමාදය දුරු කරයි.



6. යතො ච ඛො භික්ඛවෙ භික්ඛුනො අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අභිජ්ඣාවිසමලොභො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා බ්‍යාපාදො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, කොධො චිත්තස්ස උපක්කි-ලෙසොති ඉති විදිත්වා කොධො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, උපනාහො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා උපනාහො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මක්ඛො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මක්ඛො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, පළාසො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා පළාසො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, ඉස්සා චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ඉස්සා චිත්තස්ස උපක්කි-ලෙසො පහීනො හොති, මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මච්ඡරියං චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මායා චිත්තස්ස උපක්කිලෙ-සොති ඉති විදිත්වා මායා චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, සාඨෙය්‍යං චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා සාඨෙය්‍යං චිත්තස්ස උපක්කි-ලෙසො පහීනො හොති, ථම්භො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා ථම්භො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, සාරම්භො චිත්තස්ස උපක්කි-ලෙසොති ඉති විදිත්වා සාරම්භො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මානො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මානො චිත්තස්ස උපක්කි-ලෙසො පහීනො හොති, අතිමානො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා අතිමානො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, මදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා මදො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති, පමාදො චිත්තස්ස උපක්කිලෙසොති ඉති විදිත්වා පමාදො චිත්තස්ස උපක්කිලෙසො පහීනො හොති.

7. සො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතො හොති: සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා, එස භගවතො සාවකසඞ්ඝො ආහුනෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.



6. මහණෙනි, යම් කලෙක මහණකුගේ අභිධ්‍යාවිෂමලෝභය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ අභිධ්‍යාවිෂමලෝභය ප්‍රහීණ වූයේ වේ ද, ව්‍යාපාදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ව්‍යාපාදය ප්‍රහීණ වූයේ වේ ද, ක්‍රෝධය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ක්‍රෝධය ප්‍රහීණ වූයේ වේ ද, බද්ධවෛරය (උපනාහය) සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ බද්ධවෛරය ප්‍රහීණ වූයේ වේ ද, ගුණමකුකම (මක්ඛය) සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ගුණමකුකම ප්‍රහීණ වූයේ වේ ද. පලාසය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ පලාසය ප්‍රහීණ වූයේ වේ ද, ඊර්ෂ්‍යාව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ඊර්ෂ්‍යාව ප්‍රහීණ වූයේ වේ ද, මසුරුකම සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ මසුරුකම ප්‍රහීණ වූයේ වේ ද, මායාව සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ මායාව ප්‍රහීණ වූයේ වේ ද, කපටිකම සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ කපටිකම ප්‍රහීණ වූයේ වේ ද, ථම්භය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ ථම්භය ප්‍රහීණ වූයේ වේ ද, සාරම්භය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ සාරම්භය ප්‍රහීණ වූයේ වේ ද, මානය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ මානය ප්‍රහීණ වූයේ වේ ද, අතිමානය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ අතිමානය ප්‍රහීණ වූයේ වේ ද, මදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත කිලුටු කරන්නක් වූ මදය ප්‍රහීණ වූයේ වේ ද, ප්‍රමාදය සිත කිලුටු කරන්නෙකැයි මෙසේ දැනීමෙන් සිත

කිලුටු කරන්නක් වූ ප්‍රමාදය ප්‍රහීණ වූයේ වේ ද,

7. හෙතෙම බුදුරජාණන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි: "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කාරණයෙන් අර්හත්හ. සම්‍යක්සම්බුද්ධයහ, අෂ්ට විද්‍යාවෙන් හා පසළොස් චරණධර්මයන්ගෙන් යුක්තයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තර පුරිසදම්මසාරථියහ, දෙව්මිනිසුන්ගේ ශාස්තෘහ. බුද්ධයහ, භගවත්හ," කියා යි. ධර්මයෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි: "භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනා කොට දෙසන ලද්දේ ය. සන්දිට්ඨික ය (තමා විසින් දක්ක යුතු ඵල ඇත්තේ ය) අකාලික (කල් නො යවා විපාක දෙන්නේ) ය. එහිපස්සික 'එව, මෙය බලව' යි දක්වීමට සුදුසු) ය. ඕපනයික (සිත්හි එළවිය යුතු) ය. නුවණැත්තන් විසින් තමන් තමන් කෙරෙහි ලා දත යුතු ය" කියා යි. සඞ්ඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි: "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා සුපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා උජුපටිපන්න ය, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා ඤායපටිපන්න ය. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝයා සාමීචිපටිපන්න ය. යම් මේ සොතාපන්නාදි පුරිස යුගල සතරෙක් වේ ද, (සොතාපත්තිමග්ගට්ඨ සොතාපත්තිඵලට්ඨ ආදි) පුරිස පුග්ගලයෝ අට දෙනෙක් වෙත් ද, මේ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසඞ්ඝ තෙමේ දුර සිට ගෙනා සිවුපසය ලැබීමට සුදුසු ය. ආගන්තුකසත්කාරය ලැබීමට සුදුසු ය. දක්ෂිණාවට සුදුසු ය. දෙහොත් මුදුන් දී වැඳීමට සුදුසු ය. ලොකයාට උතුම් පින්කෙත ය" කියා යි.



8. යතොපි[1] ඛො පනස්ස චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං. සො බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතොම්හීති ලභති අත්ථවෙදං. ලභති ධම්මවෙදං. ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. ධම්මෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතොම්හීති ලභති අත්ථවෙදං. ලභති ධම්මවෙදං. ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. සඞ්ඝෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතොම්හීති ලභති අත්ථවෙදං. ලභති ධම්මවෙදං. ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති. 'යතොපි[1] ඛො පන මෙ චත්තං වන්තං පහීනං පටිනිස්සට්ඨ'න්ති ලභති අත්ථවෙදං. ලභති ධම්මවෙදං. ලභති ධම්මූපසංහිතං පාමුජ්ජං. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති. සුඛිනො චිත්තං සමාධියති.

9. ස ඛො සො භික්ඛවෙ භික්ඛු එවංසීලො එවංධම්මො එවංපඤ්ඤො

සාලීනඤ්චෙපි පිණ්ඩපාතං භුඤ්ජති විචිතකාළකං අනෙකසූපං අනෙකබ්‍යඤ්ජනං, නෙවස්ස තං හොති අන්තරායාය. සෙය්‍යථාපි භික්ඛවෙ වත්ථං සඞ්කිලිට්ඨං මලග්ගහිතං අච්ඡං උදකං ආගම්ම පරිසුද්ධං හොති පරියොදාතං, උක්කාමුඛං වා පනාගම්ම ජාතරූපං පරිසුද්ධං හොති පරියොදාතං, එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු එවංසීලො එවංධම්මො එවංපඤ්ඤො, සාලීනඤ්චෙපි පිණ්ඩපාතං භුඤ්ජති විචිතකාළකං අනෙකසූපං අනෙකබ්‍යඤ්ජනං, නෙවස්ස තං හොති අන්තරායාය.

10. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං. තථා තතියං. තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති. කරුණාසහගතෙන චෙතසා -පෙ- මුදිතාසහගතෙන චෙතසා -පෙ- උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති. තථා දුතියං. තථා තතියං. තථා චතුත්ථිං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරති.

1. යථොති - සීමු "අට්ඨකථායං 'යථොති' ඉති පාඨන්තරවසෙන නිද්දිට්ඨං.



8. යම් හෙයකින් ඒ මහණහු විසින් උපකෙලශ දුරු කරන ලද්දේ ද, වමනය (නැවත නො ගන්නා සේ බැහැර කරණ ලද්දේ ද), මුදන ලද්දේ ද, ප්‍රහීණ කරණ ලද්දේ ද, දුරු කරණ ලද්දේ ද, හෙ තෙමේ 'මම බුදුන් කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වෙමි'යි අර්ථවෙදය (බුද්ධාදීන් කෙරෙහි අවෙත්‍යප්‍රසාදයෙන් ඇති වන සොම්නස) ලබයි. ධර්මවෙදය (සොම්නසින් උපන් ඥානය) ලබයි. සොම්නසින් හා ඥානයෙන් යුක්ත ප්‍රමොදය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය හටගනියි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හිඳුනු කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. 'ධර්මය කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වෙමි'යි අර්ථවෙදය ලබයි. ධර්මවෙදය ලබයි. සොම්නසින් හා ඥානයෙන් යුක්ත ප්‍රමොදය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය හට ගනියි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සන්හිඳෙයි. සන්හිඳුනු කය ඇත්තේ සැප විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. 'සඞ්ඝයා කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් යුක්ත වෙමි'යි අර්ථවෙදය (ගුණ දැන පැහැදීම නිසා ඇති වන සොම්නස) ලබයි. ධර්මවෙදය (සොම්නසින් උපන් ඥානය) ලබයි. සොම්නසින් හා ඥානයෙන් යුක්ත ප්‍රමොදය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීති

ඇති වෙයි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙයි. සන්සිඳුනු කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. 'යම් හෙයකින් මා විසින් උපක්ලේශ ත්‍යක්තය, වමිතය, ප්‍රහීණය, ප්‍රතිනිස්සෘෂ්ට ය' යි සිතන්නේ අර්ථවේදය ලබයි. ධර්මවේදය ලබයි. සොම්නසින් හා කරුණයෙන් යුක්ත ප්‍රමෝදය ලබයි. ප්‍රමුදිත වූවහුට ප්‍රීතිය හට ගනියි. ප්‍රීතියෙන් යුත් සිත් ඇත්තහුගේ කය සන්සිඳෙයි. සන්සිඳුනු කය ඇත්තේ සුව විඳියි. සුව ඇත්තහුගේ සිත සමාධිගත වෙයි.

9. මහණෙනි, මෙබඳු සිල් ඇති මෙබඳු දහම් ඇති මෙබඳු නුවණ ඇති ඒ අනාගාමි මහණ තෙම බැහැර කල කළු සහල් ඇති නොයෙක් සූපව්‍යඤ්ජන ඇති ඇල්සාලේ බත වළඳයි ද, ඔහුට එය මාර්ගඵලාන්තරාය පිණිස නො වෙයි. මහණෙනි, යම්සේ කිලුටු වූ මල ගත් වස්ත්‍රයක් පිරිසුදු ජලයට පැමිණ පිරිසුදු වූයේත් පබසර වූයේත් වේ ද, උදුන්මුවට පැමිණ රන් පිරිසිදු වූයේත් බබලන්නේත් වේ ද, මහණෙනි, එපරිද්දෙන් ම මෙබඳු සිල් ඇති මෙබඳු දහම් ඇති මෙබඳු නුවණ ඇති භික්ෂු තෙම බැහැර කල කළු සහල් ඇති නොයෙක් සූපව්‍යඤ්ජන ඇති ඇල්සහලේ බත වළඳන්නේ නමුත් එය ඔහුට මාර්ගඵලාන්තරාය පිණිස නො වෙයි.

10. හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේ ම දෙවෙනි දිශාව ද, එසේ ම තෙවෙනි දිශාව ද, එසේ ම සිවු-වැනි දිශාව ද, එසේ ම උඩ යට සරස ද සියලු තන්හි සියල්ලන් තමන් හා සම කොට ගැන්මෙන් සියලු සතුන් ඇති ලොව විශාල වූ මහත්බවට පැමිණි අප්‍රමාණ වූ අවෛරයෙන් අව්‍යාපාදයෙන් (මෛත්‍රියෙන්) පතුරුවා වාසය කෙරෙයි. කරුණාසහගත සිතින්... මුදිතාසහගත සිතින්... උපෙක්ඛා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේ ම දෙවෙනි දිශාව ද, තෙවෙනි දිශාව ද, එසේ ම සිවුවැනි දිශාව ද, එසේ ම උඩ යට සරස ද සියලු තන්හි සියල්ලන් තමන් හා සම කොට ගැන්මෙන් සියලු සත්ත්වයන්ගෙන් යුක්ත වූ ලෝකය විශාල වූ මහත්බවට පැමිණි අප්‍රමාණ වූ අවෛර වූ නිදුක් වූ උපෙක්ෂාසහගත සිතින් පතුරුවා වාසය කරයි.